(13 (1) නියෝගය)
10 ආකෘති පත්‍රය

# කාර්මික පතල් කැනීම් බලපත්‍රය

ආර්ථික ජවයතා වාර්තාව - ආකෘතිය හා අන්තර්ගත කරුණු
( අ සහ ආ වර්ග සඳහා පමණකි)

ආර්ථික ජවයතා වාර්තාවක, මෙහි පහත දැක්වෙන විස්තර, පිඹුරු සිතියම් ඇතුළත් විය යුතුයි.

1. දේපල පිඹුර - විස්තරයට මායිම් මැනුම

2. සංවර්ධන නිෂ්පාදන වැඩසටහන

අ. නිධි ඉතිරි කර තබාගැනිම
ආ. පතල් කැනීම් සැලැස්ම - පතලේ ජීව කාලය, වැඩසටහන යොදාගන්නා ක්‍රම
ඇ. පිරිසැකසුම් ක්‍රම සැලැස්ම - මිලිං, බෙනිපිසියේෂන්, ප්ලෝ චාට්, කාල සටහන් ක්‍රම
ඈ. (ටේලිංස් ,අපද්‍රව්‍ය, පාලනය ඇතුලත්ව පරිසර ආරක්ෂණ සැලැස්ම)
ඉ. යන්ත්‍රස්ථානයේ පිහිටිම / පහසුකම් : පිහිටිම සැලැස්ම ප්‍රවේශය, ජලය බලශක්තිය, ඉදිකිරීම (අදාල අවස්ථා වලදී)
ඊ. පතල් ප්‍රතිසංස්කරණ සැලැස්ම - සැලසුම් නිර්මානයට ප්‍රගාමි වැඩබිම් පුනරුත්ථාපන ක්‍රියාවලිය.

යෝජිත පතල් කැනීම් කටයුතු වල ප්‍රමාණය අනුව, අතිරේක ලිපිගත විස්තර ලබාගැනිම අවශ්‍ය වන බව අධ්‍යක්ෂවරයා නිශ්චය කරන අවස්ථාවලදී මෙහි පහත සඳහන් සියළු තොරතුරු හෝ ඉන් කොටසක් හෝ සපයන ලෙස නියම කරනු ලැබිය හැකිය.

3. අලෙවි කිරීමේ හා විකිණිමේ සැලැස්ම

4. ශුද්ධ ආදායම් විග්‍රහය / මුදල් ලැබෙන ආකාරය පිලිබඳ විග්‍රහය (කැෂ් ප්ලෝ ඇනැලිසිස්)

5. ප්‍රාග්ධන පිරිවැය - ඉඩම්, ගොඩනැගිලි, උපකරණ, කාරක ප්‍රාග්ධනය

6. ක්‍රියාත්මක කිරීමේ පිරිවැය - කාර්‍ය මණ්ඩලය, ප්‍රතිලාභ පර්පාලන, නඩත්තු , සෞඛ්‍යය සහ ආරක්ෂාව,පරිසරය , රාජ්‍ය භාල, බදු බැඳුම්, මුදල් සැපයුම්, උපයෝගි ද්‍රව්‍ය, ප්‍රවාහනය ආරක්ෂාව,

7. සේවා නියුක්තිය හා පුහුණු කිරීමේ වැඩසටහන

8. පාරිසරික බලපෑම් අධ්‍යනය

අ) බේස්ලයින් ඩේටා (ආධාරක දත්ත)

පස මතුපිට හා භූගත ජලය, වාතයේ තත්වය හා ශබ්ද මට්ටම්, ශාක සහ සතත්ව ජීවය පිළිබඳ නියැදි ගැනිම සහ හෝ ඒවා විශ්ලේෂණය

ආ) නිෂ්පාදනයේ බලපෑම් :

දැනට පවත්නා ජනාවාස හා වර්තමානයේ ඉඩම්, ජලය සහ සත්ව සහ ශාබ සම්පත් ප්‍රයෝජනයට ගන්නා ආකාරය කෙරෙහි පතල් කැනීමෙන්, මෝල් හා යන්ත්‍ර ස්ථාන වලින්, ද්‍රව්‍ය ඉවත් කරගැනිම හා ප්‍රවාහනයෙන්, නිවාස හා කම්කරු වැඩ වලින් ඇතිවිය හැකි බලපෑම් පිළිබඳ විග්‍රහයක්

9. සවිස්තර පතල් ප්‍රතිසංස්කරණ සැලැස්ම :

9. සවිස්තර පතල් ප්‍රතිසංස්කරණ සැලැස්ම :

පතල් කැනීම් කටයුතු වල ප්‍රථිපලයක් වශයෙන් පරිසරය පරිහානියට පත් කිරීමට ඉඩ තිබෙන සහ හෝ පරිසරයට අන්තරාදායක විය හැකි ජල දූෂණය, පස දූෂණය, ශබ්දය, පුපුරණ ද්‍රව්‍ය සහ වෙනත් සියළුදේ ආශ්‍රිතව එම හානිකර බලපෑම් හැසිරවීම, සමීක්ෂණය හා ඒවා ප්‍රගාමීව පාලනය කිරීම සහ ඒවාට ප්‍රතිකර්ම යෙදීමේ ක්‍රියාමාර්ග, කාල සටහන් සහ ඇස්තමේන්තු කල වියදම් මෙහි සඳහන් ප්‍රතිසංස්කරණ වැඩ සම්පූර්ණ කිරීම පිළිබඳව අනුක්‍රමික හා අවසාන කාල සටහන සඳහන් කලයුතුයි.

10. ප්‍රතිසංස්කරණ බැඳුම්කර :

පතල් යථා තත්වයට පත් කිරීම් ප්‍රතිසංස්කරණ සැලැස්ම විශ්ලේෂණය කර අනුමත කල පසුව යථා තත්වයට පත් කිරීමේ බැඳුම්කරයකට ඇතුළත් වන ලෙස අධ්‍යක්ෂවරයා මගින් නියම කල හැකිය. බලපත්‍රලාභියා විසින් ප්‍රතිසංස්කරණ සැලැස්මේ විස්තර දැක්වෙන පිරිවැය පදනම් කරගෙන, බැඳුම්කරයේ ඇප විය යුතු මුදල් ප්‍රමාණය ආගණය කරනු ලැබේ. එම පිරිවැයට සහ නියමිත ඇපයට මෙහි පහත සඳහන් යථාතත්වයට පත්කිරීමේ ප්‍රතිසංස්කරණ කටයුතු එකක් හෝ වැඩි ගණනක් කිරීම සඳහා අවශ්‍ය වර්තමාන කම්කරු කුලිය, උපකරණ සේවා සහ සැපයුම් යනාදිය සඳහා ඇස්තමේන්තු කල වියදම ඇතුලත් විය යුතුයි.

- අ) ගොඩනැගිලි හා යන්ත්‍ර ස්ථාන පහසුකම් ඉවත් කිරීම
- ආ) පතල් වලවල්, පතස්, ඩික්ලයින් සහ පතල් ලිං කටවල ආරක්ෂිත වැසීම
- ඇ) පතල් ප්‍රදේශ (ටේලිං ඒරියා) අධික බෑවුම සහිත ගල් මුහුණත්, ජලවහන පාලන ප්‍රදේශ ස්ථාපනය කිරීම
- ඈ) මතුපිට භූමිය සමෝච්චව සැකසීම
- ඉ) නැවත වෘක්ෂලතා වැවීම

පිළිගත හැකි බැඳුම්කරවලට, මුදල් ජාත්‍යන්කර පිලිගැනීමක් ඇති බැංකුවක ණයවර ලිපියක්, ඇපකරයක් හෝ ගනුදෙණු කලහැකි වෙනත් බැඳුම්කරයක් හෝ වෙනත් අනුමත කල ඇප බැඳුම්කරයක් ඇතුළත් විය හැකිය. සැලැස්මේ මූලික අංග හැර බැඳුම්කරයේ මුදල අවුරුදු දෙකකින් දෙකට සමාලෝචනය කර සංශෝධනය කරනු ලැබීමට නියමිතය.

හේ/ජාප්‍ර.